# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,841 — 1959 අගෝස්තු 28 වැනි සිකුරාද — 28.8.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## IV වැනි කොටස – පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 711 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | 713 |


## පළාත් පාලන නිවේදන

### 1950හේ අංක 19 දරන විදුලි බලය පිළිබඳ ආඥාපනත

ජී. ඒ.—11/37/11.

ගමනාගමන හා විදුලි බලය පිළිබඳ අමාත්‍යතුමාගෙන් විමසා පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ ඇමතිණිය විසින් දෙනලද අනුමතිය ඇතුව බදුල්ල දිස්ත්‍රික්කයේ බෝගොඩ ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් 1950 හේ අංක 19 දරණ විදුලි බලය පිළිබඳ ආඥාපණතේ 46 වන් වගන්තිය යටතේ සම්පාදිතවූ නියෝග.

වී. සී. ජයසූරිය.
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍ය කායඹාංශයේ ස්ථාවර ලේකම්තැන.

1959 යේ ජූලි මස 29 වැනි දින,
කොළඹ.

#### නියෝග

1. මේ නියෝගවල—

"ආඥාපණත" යනුවෙන් 1950හේ අංක 19 දරණ. විදුලිබලය පිළිබඳ ආඥාපණත අදහස් කරණු ලැබේ.

"බලපත්‍රය". යනුවෙන් ආඥාපණත යටතේ 2 වැනි වගන්තිය යටතේ බෝගොඩ ගම් ප්‍රදේශයේ ගම්කායඹ සභාව වෙත නිකුත් කරණ ලද බලපත්‍රය අදහස් කරණු ලැබේ.

"බලපත්‍රධාරියා" යනුවෙන් බෝගොඩ ගම් ප්‍රදේශයේ ගම්කායඹ සභාව අදහස් කරණු ලැබේ.

2. බලපත්‍රධාරියාගෙන් තම ප්‍රයෝජනය පිණිස විදුලිබලය ලබා ගැනීමට බලාපොරොත්තු වන ඕනෑම කෙනෙකු විසින් විදුලිබලය ලබාගැණීමට ඕනෑකරණ දිනට යටත් පිරිසෙයින් දවස් දහහතරකට වත් කලින්—

(අ) ඒ සඳහා බලපත්‍රධාරියා විසින් සම්පාදනය කර තිබෙන පෝරමයේ ප්‍රකාරයට විය යුතුවූ ඉල්ලුම් පත්‍රයක් බලපත්‍රධාරියා වෙත ඉදිරිපත් කළ යුතුයි.

(ආ) විද්‍යුත් වේග වාහක ප්‍රධාන කම්බිය සවිකිරීම සඳහා වූ ගාස්තු බලපත්‍රධාරියාට කලින් ගෙවීම හෝ බලපත්‍රධාරියාට අවශ්‍ය නම් ආඥාපණතේ 33 වැනි වගන්තිය යටතේ බලපත්‍රධාරියා සමග ලියවිල්ලකින් වූ කොන්ත්‍රාත්තුවකට ඇතුලත් වීම කළ යුතුයි.

3. විදුලි බලය පාවිච්චිකරණ සෑම පාරිභෝගියයෙකු විසින්ම බලපත්‍රයේ සඳහන් කරණලද රේට් ගණන් අනුව එකී විදුලිබලය සඳහා මුදල් ගෙවිය යුතුය.

4. (1) පාරිභෝගිකයාට අයත් භූමිභාගයෙහි පිහිටුවා තිබෙන විද්‍යුත් වේග වාහක කම්බියේ කොටස හා විදුලිබලය වෙනස් කරන උපකරණද, ප්‍රධාන ගිනි නූල් සහ විද්‍යුත් මාපකයද, විදුලි යතුරු පුවරුවද බලපත්‍රධාරියා සතුව පවතින්නේය. බලපත්‍රධාරියා යටතේ රක්ෂාවෙහි නියුක්ත වූවකු හැර වෙන කිසිම කෙනෙකු විසින් මොනම කාරණයක් සඳහාවත් ඒවා වෙනස් කිරීම හෝ අතපතගෑම හෝ නොකළ යුතුයි.

(2) බලපත්‍රධාරියාගේ ප්‍රධාන ගිනි නූලේ හෝ විද්‍යුත් මාපකයේ තමාගේ පාර්ශවයේවූ යම් විදුලි කම්බි, වළලනලද විදුලි කම්බි, හෝ වෙනත් විදුලි උපකරණ නඩත්තු කිරීම පිළිබඳ විදුලිය පාරිභෝගිකයා විසින් වග කිව යුතුය.

(3) ආඥාපණතේ 47 (3) වැනි වගන්තිය යටතේ අසම්බන්ධ කිරීමෙන් පසුව විදුලි බලය සවිකිරීම නැවත සම්බන්ධ කරණ කල්හි එබඳු සවිකිරීම පරීක්ෂා කිරීමේ හා නැවත සම්බන්ධ කිරීමේ නියමිත ගාස්තු බලපත්‍රයේ සඳහන් කර ඇති පරිදි පාරිභෝගිකයා විසින් කළින් ගෙවිය යුතුයි.

(4) විදුලිබලය පාවිච්චිකරණ කිසියම් පාරිභෝගියෙකුගේ විදුලි කම්බිවල හෝ සවිකිරීම්වල කිසියම් කොටසකින් විදුලිබලය කාන්දුවී යතොත් එකී විදුලිය පාරිභෝගිකයා විසින් ඔහුගේ ස්ථානයේ එසේ කාන්දුවී ගිය සියළුම විදුලිබලය සඳහා මුදල් ගෙවීමට යටත් විය යුතු වන්නේය.

5. (1) තමාගේ ස්ථානයට විදුලි බලය සැපයුවාට පසු යම් විටෙක යම්කිසි ලාම්පුවක් හෝ පංකාවක් හෝ එවකට පාවිච්චිකරණ මෝටරයකට වඩා විශාලවූ මෝටරයක් පාවිච්චි කිරීමට හෝ වැඩිපුර යම්කිසි ලාම්පුවක් හෝ නිත්‍ය වශයෙන් හෝ තාවකාලික වශයෙන් විද්‍යුත් ප්‍රවාහයෙන් ක්‍රියා කරණ උපකරණයක් සවිකිරීමට හෝ තමාගේ දේපලෙහි ඇද තිබෙන විදුලි කම්බි කොයි අන්දමකින් නමුත් වෙනස් කිරීමට හෝ දික් කිරීමට හෝ අදහස් කරණ සෑම පාරිභෝගිකයකු විසින්ම තමාගේ අදහස් එකී වෙනස් කිරීම හෝ දික් කිරීම පිළිබඳ කර්මාන්ත ආරම්භ කිරීමට යටත් පිරිසෙයින් දින දෙකකටවත් කළින් බලපත්‍රධාරියාට ලියවිල්ලකින් දැනුම් දිය යුතුවාත් හැර විදුලි කර්මාන්ත පිළිබඳ කොන්ත්‍රාත් කරුවකු ලවා ඒ වැඩය කරවීමට තමා අදහස් කරන්නේනම් එකී කොන්ත්‍රාත් කරුවාගේ නම සහ ලිපිනයද බලපත්‍රධාරියා වෙත දැනුම් දිය යුතුයි.

2. විදුලිය පාරිභෝගිකයෙකු විසින් කිසියම් දික් කිරීමක්, ලාම්පුවක්, පංකාවක් හෝ එවකට පාවිච්චි කරණ මෝටරයකට වඩා විශාලවූ මෝටරයක් සම්බන්ධ කිරීම හෝ සම්බන්ධ කරවිම කිසියම් වැඩිපුර ලාම්පුවක් හෝ වෙනත් කිසියම් උපකරණ නිත්‍ය වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ ප්‍රධාන සවි කිරීමට සම්බන්ධ කිරීම එකී දික් කිරීම—ලාම්පුව, පංකාව, මෝටරය, වැඩිපුර ලාම්පුව හෝ වෙනත් උපකරණ සෝදිසිකොට හා පරීක්ෂාකොට බලා සතුටුදායක යයි බලපත්‍රධාරියා විසින් ඒ සඳහා බලය දෙනලද නිලධාරියෙකු විසින් ඒත්තු ගතහොත් මිස නැත්නම් එසේ නොකළ යුතුය.

6. (1) කිසියම් ස්ථානයක බලපත්‍රධාරියාගේ ප්‍රධාන ගිනි නූල උනුවී යතහොත් පාරිභෝගිකයා විසින් ඒ බව බලපත්‍රධාරියාගේ විද්‍යුත්පාදකාගාරය හෝ උප විද්‍යුත්පාදකාගාරය භාරව සිටින නිළධාරිතුමා වෙත ඒ ඒ කාරණාවේ හැටියට වහාම දන්විය යුතුයි.

(2) බලපත්‍රධාරියා විසින් බලය දෙනලද නිළධාරියකුට හෝ බල පත්‍රධාරියා විසින් සේවයෙහි යොදාගෙන සිටින කිසියම් කම්කරුවෙකුට බාහිරවූ වෙනත් කිසිවකු විසින් බලපත්‍රධාරියාගේ දේපල වශයෙන් සැළකෙන කිසියම් උනුවී ගිය ගිනි නූලක් නැවත සවිකළ යුතු නැත.

(3) බලපත්‍රධාරියාගේ හෝ පාරිභෝගිකයාගේ දේපල වශයෙන් සැළකෙන ගිනි නූලක් නැවත සවිකිරීමට බලපත්‍රධාරියාගේ කිසියම් නිළධාරියෙකුගේ හෝ කම්කරුවෙකුගේ සේවය අවශ්‍යවූ විට ඒ සඳහා ගෙවියයුතුවූ බලපත්‍රයේ සඳහන් නියමිත ගාස්තුව පාරිභෝගිකයාගේ එම මාසයේ ගණන් බිලට් වලට ඇතුලත් කළ යුතුය.

7. සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් හෝ විදුලිබලය සැපයීමේදී සිදුවන බාධා හේතුකොටගෙන නියම වශයෙන් හෝ අනියම් වශයෙන් සිදුවියහැකි පාඩුවක් හෝ අලාභහානියක් සම්බන්ධයෙන් බලපත්‍රධාරියා විසින් පාරිභෝගිකයාට වග කියනු නොලැබේ.

8. ආඥාපණතේ 45 වැනි වගන්තිය යටතේ අසම්බන්ධකොට තිබුනාවූ සේවයක් නැවත සම්බන්ධ කරණ කල්හි එය පරීක්ෂා කොට බලා නැවත සම්බන්ධ කිරීම සඳහා බලපත්‍රයේ සඳහන් පරිදි ගාස්තුවක් අයකළයුතුවාත් හැර පාරිභෝගිකයා විසින් එය කළින් ගෙවිය යුතුද වන්නේය.

9. (1) සියළුම ගාස්තු ගණුදෙනු ඉදිරිපත් කරණ දිනයට අය විය යුතුව තිබෙන්නාසේ සළකනු ලැබේ.

(2) ගණුදෙනු පිළිබඳව යම් පැමිණිල්ලක් එකී ගණුදෙනු ඉදිරිපත් කොට සතියක් ඇතුලත දී කරණ ලද්දේ නම් මිස නැත්නම් ගණුදෙනුවල වැරදි පිළිබඳවූ කිසිම පැමිණිල්ලක් බලපත්‍රධාරියා විසින් භාරගනු නො ලැබේ.

10. (1) තමාගේ ස්ථානය සඳහා විදුලිබලය සැපයීම අවශ්‍ය නොවන සෑම පාරිභෝගිකයෙකු විසින්ම ඒ පිළිබඳ දින තුනක ලියවිල්ලකින්වූ දන්වීමක් බලපත්‍රධාරියා වෙත දිය යුතුය.

(2) (1) වැනි ඡේදයේ සඳහන් පරිදි එසේ දන්වීමක් කර නොමැති කල්හි පාරිභෝගිකයාට විදුලිබලය අවශ්‍යබව දන්වමින් බලපත්‍රධාරියාට දන්වීම ලැබුන දිනසිට දවස් තුනක් ගතවන තුරු ඒ ස්ථානයේවූ බලපත්‍රධාරියාගේ විදුලිය උපකරණ සඳහා පාරිභෝගිකයා වග කිවයුතුවාත් හැර එහි පාවිච්චි කරන්නට යෙදුණු සියළු විදුලිබලය සම්බන්ධයෙන් ගාස්තු ද ගෙවිය යුතුය. එහෙත් එකී දවස් තුන අවශාන වන්නට මත්තෙන් බලපත්‍රධාරියා විසින් සේවය අසම්බන්ධ කරණලද්දේ නම් ඒ ස්ථානයේ පාවිච්චි කරණලද විදුලිබලය සම්බන්ධයෙන් පාරිභෝගිකයා වගකිවයුත්තේ එසේ අසම්බන්ධ කල වේලාව දක්වා පමණකි.

11. (1) කිසිම පාරිභෝගිකයෙකු විසින්—

(අ) බලපත්‍රධාරියාගේ ප්‍රධාන විද්‍යුත් වේග වාහක කම්බියට සම්බන්ධ කිරීමට අදහස් කරණ පාරිභෝගිකයාගේ කිසියම් දේපලක පිහිටි අලුත් විදුලි කර්මාන්ත සඳහා කම්බි ඇදීම හෝ උපකරණ සවි කිරීම හෝ සම්බන්ධයෙන් කිසිම වැඩක් කරගෙන යෑම, හෝ

(ආ) කිසියම් ස්ථානයක විදුලිබලය සැපයීම පිළිබඳවූ උපකරණ බල පත්‍රධාරියාගේ විද්‍යුත් වේග වාහක කම්බියට සම්බන්ධ කළාට පසු—

(1) එකී විදුලිබලය සැපයීම පිළිබඳවූ උපකරණ සවිකිරීම හෝ ඒවා වෙනස් කිරීම, හරිගැස්සීම අමුතුකිරීම හෝ අළුත්වැඩියා කිරීම යනාදියෙන් සමන්විත වූ, හෝ

(2) එබඳු සවිකිරීමක සවභාවය හා ප්‍රමාණයට කිසිම ආකාරයකින් හානි නොවන්නාවූ පරිද්දෙන් සාමාන්‍ය වශයෙන් ලාම්පු, පංකා විදුලි, යතුරු හෝ සේවයට අවශ්‍ය වෙනස් කොටස් දැමීමෙන් බාහිරවූ කිසිම විදුලි කර්මාන්තයක් කිරීම හෝ කරගෙණ යාම හෝ, සඳහා—

(අ) විදුලිය කර්මාන්තය පිළිබඳ කටයුතු භාරගැනීමට අවශ්‍ය දක්ෂතාවය හෝ විදුලිය කටයුතු පිළිබඳ පිළිගත් කර්මාන්තශාලාවක හෝ ව්‍යාපාරික ස්ථානයක හෝ විද්‍යුත්පාදකාගාරයක කටයුතු කිරීමෙන් යටත් පිරිසෙයින් අවුරුදු තුනකවත් පළපුරුද්දක් හෝ තිබේය කියා ප්‍රධාන ඉංජිනේරුවා විසින් හා ආණ්ඩුවේ විදුලිය කටයුතු දෙපාර්තමේන්තුවේ කළමනාකාරයා විසින් සහතික කරණු ලැබුවාවූ, හා

(ආ) විදුලිය පිළිබඳ ඉංජිනේරු කර්මාන්තයෙහි අවුරුදු දෙකකට වඩා අඩු නොවූ කාලසීමාවක් නිතිපතා සේවයෙහි යෙදී සිටියාවූ කිසියම් කෙනෙකුට බාහිර වශයෙන්වූ වෙනත් කෙනෙකු යොදවා ගතයුතු නැත.

12. (1) යෝජනාකර තිබෙන කර්මාන්තය බලපත්‍රධාරියාගේ නිළධාරියෙකුට පරීක්ෂා කිරීමට හැකි වන පරිද්දෙන් ඒ පිළිබඳ දවස් දෙකකට අඩුනොවූ දින ගණනකට කළින් දැනුම්දීමෙන් පසුව මිස එවකට සවිකොට තිබෙන විදුලිකම්බි යන්ත්‍ර සූත්‍ර උපකරණ ආදිය වෙනස් කිරීම හෝ ඒවාට අමුතුවෙන් යමක් එකතු කිරීම හෝ ඒවා හරිගැස්සීම හෝ විදුලිකම්බි යන්ත්‍ර සූත්‍ර උපකරණ ආදිය සවිකිරීම වැනිවූ කිසිම විදුලි කර්මාන්තයක් හෝ කරගෙණයාම නොකළයුතුයි.

(2) යෝජනාකර තිබෙන කර්මාන්තය (1) වැනි ඡේදයේ සඳහන් නිළධාරියා අනුමත කරතොත් ඔහු විසින් විද්‍යුත්මාපකය සවිකරණ ස්ථානය ගැන කොන්ත්‍රාත්කාරයා සමග සමථයකට පැමිණිය යුතුවාත් හැර ආඥාපණතේ 60 වැනි වගන්තිය යටතේ සම්පාදිත නියෝගවලට අනුකූලව ඔහු විසින් ඒ කර්මාන්තය කරගෙණ යා යුතු වන්නේය.

13. (1) 12. වැනි නියෝගයේ සඳහන් කිසියම් විදුලි කර්මාන්තයක් අවසාන කිරීමෙන් පසුව බලපත්‍රධාරියා විසින් ඒ සඳහා බලය දෙනලද නිළධාරියකු විසින් එකී කර්මාන්තය පරීක්ෂා කොට නිවැරදියයි සෝදිසි කළයුතුය.—

(අ) විදුලි කම්බි ආදිය සවි කිරීම නියමිතවූ නියෝගවලට එකඟව පවත්නේ නම් ඒ ස්ථානයට විදුලි බලය සැපයීම කරණු ලැබේ.

(ආ) විදුලි කම්බි ආදිය සවිකිරීම නියමිතවූ නියෝගවලට එකඟව නොපවත්නේ නම් විදුලි කම්බි ආදිය සවිකිරීම එකී නියෝගවලට එකඟවන පරිද්දෙන් සකස් කරණතුරු ඒ ස්ථානයට විදුලි බලය සපයනු නොලැබේ.

(2) මේ නියෝගය යටතේ කිසියම් විදුලි කර්මාන්තයක් පරීක්ෂාකොට නිවැරදියයි සෝදිසිකොට බැලීම පිණිස ගෙවියයුතු ගාස්තුව පාරිභෝගිකයා විසින් කළින් ගෙවියයුතුය.

14. බලපත්‍රධාරියාට දන්වීමක් නොකොට හෝ ඔහුගේ අනුමතිය කලින් ලබා නොගෙන හෝ අළුතෙන් විදුලි උපකරණ සවිකිරීමක් සම්බන්ධයෙන්වූ යම් වැඩක් යම් ස්ථානයක කරගෙණ යන්නේ නම් බලපත්‍රධාරියා විසින් ඒ ස්ථානයට විදුලිබලය සැපයීම ප්‍රතික්ෂෙප කළහැකිය. එසේ නැතහොත්, අවශ්‍යයයි බල්පත්‍රධාරියා අදහස් කරණ පරිද්දෙන් විදුලි කම්බි ඇද තිබෙනහැටි වෙනස් කිරීමට හෝ අමුතු කිරීමට හෝ බලපත්‍රධාරියා විසින් ඒ සඳහා බලය දෙනලද නිළධාරියාට පුළුවන. එකී වෙනස් කිරීම් හෝ අමුතු කිරීම් විධිමත් පරිදි කර තිබේනම් එකී නිළධාරියා විසින් විදුලි කම්බි, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ආදිය නැවත පරීක්ෂාකොට නිවැරදි යයි සෝදිසිකොට බලා නියම පිළිවෙලට ඒවා සවිකොට ඇතිබව පෙණී ගියහොත් එකී ස්ථානයට විදුලි බලය සපයනු ලැබේ.

15. බලපත්‍රධාරියා වෙත කලින් කරණලද දන්වීමක් නැතිව හෝ ඔහුගේ අවසරය නොමැතිව බලපත්‍රධාරියා ගේ විද්‍යුත්වේගවාහක කම්බියට දැනට සම්බන්ධකර තිබෙන්නාවූ කිසියම් විදුලිකම්බි ආදියක් දික්කරණු ලැබුවහොත් එවිට එකී විදුලි කර්මාන්තය සම්පූර්ණයෙන්ම බලපත්‍රධාරියාගේ විද්‍යුත්වේග වාහක කම්බියෙන් අසම්බන්ධකිරීමට යටත් වන්නේය.

16. යම් විදුලි කර්මාන්තයක් නැවත සම්බන්ධ කිරීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම බලපත්‍රධාරියා විසින් ඒ සඳහා සපයනු ලබන පෝර්මයේ ප්‍රකාරයට වියයුතුවාත් හැර විදුලිබලය සැපයීමේ අවශ්‍යතාවයට පැය 48 කට මත්තෙන් එය බලපත්‍රධාරියාගේ කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.

ඇල්.ජී.ඩී.—ජී.සී. 14/29/1.

## 1952කේ අංක 6 දරන ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

1952 කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්මත කරගන්නාලද පහත දැක්වෙන යෝජනාව් එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළකරනු ලැබේ.

**යෝජනාව**

ප්‍රදේශ පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලද්දාවූද, සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 ක්වූ අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 4 දක්වාද 6 සිට 37 දක්වා කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට නාරම්මල ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් 1952 කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

පී. බී. මැදගොඩ,
සභාපතිතැන,
නාරම්මල ගම්කාර්‍ය සභාව.

නාරම්මල ගම්සභා කාර්‍යාලය,
නාරම්මල, 1959.7.18 දින දීය.

---

# විවිධ දැන්වීම්

## පාතදුම්බර පලිස්පත්තුවේ බටහිර ගම්කාර්‍ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයෙහි 1959 යේ වර්ෂයේ මස් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බැවින්, මෙම බල පත්‍රය නිකුත් කිරීම ගැන පාතදුම්බර පලිස්පත්තුව බටහිර ගම්කාර්‍ය සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමණ කරුණු නිසාද යනාවග ඇතුලත් ලියකියවිල්ලක් පිටපත් දෙකක් සහිතව, මෙම-දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට සති දෙකක් ඇතුලත මා වෙත එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරන 1947 අංක 44 දරන ආඥාපණතින් සංශෝධිතවූ අංක 6 දරන ආඥාපණත යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| ආනා බුහාරි ... | අංක 15, හුලුගඟ ... | එලුමස් |

එච්. ඇම්. හේරත් බන්ඩා,
පලිස්පත්තුව බටහිර ගම්සභාපති තැන,

ගම්සභා කාර්‍යාලය,
නාරන්පනාව, 18.8.59.

---

## විශෙෂ නිවේදනයයි

1959 සැප්තැම්බර් 16 වැනි බදාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1959 සැප්තැම්බර් 18 වැනි දින නිකුත්කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1959 සැප්තැම්බර් 12 වැනි සෙනසුරාදා පස්වරු 12.30 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1959 අගෝස්තු 18 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.